
කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 39, රත්නපුර හා ඇහැලියගොඩ යන මැතිවරණ කොට්ඨාස දෙකටම අයත් වේ. ඒ අනුව ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මායිම්ව ඒ ආසන්නයේ පිහිටි තලාවිටිය, අමුහේන්කන්ද, බෝධිමළුව, පත්බේරිය, බටහිර පත්බේරිය, මෙනේරිපිටිය, පරකඩුව, පුස්සැල්ල, පොහොරබාව, මිල්ලවිටිය, මියනදෙණිය යන ග්‍රාම නිලධාරී වසම් 11 ඇහැලියගොඩ මැතිවරණ කොට්ඨාසයට අයත් වන අතර සෙසු ග්‍රාම නිලධාරී වසම් 28 රත්නපුර මැතිවරණ කොට්ඨාසයට අයත් වේ.

**සිතියම් අංක 03** **කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මැතිවරණ කොට්ඨාස**



## සිතියම් අංක 04: කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාර්ග ව්‍යාප්තිය

කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මාර්ග ව්‍යාප්තිය පහත සිතියම් අංක 04 මගින් පෙන්වා දී ඇත. එම සිතියමට අනුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය පුරා විහිදී ගිය මාර්ග ව්‍යාප්තියක් දක්නට ලැබේ. ප්‍රදේශයේ පවත්නා වඩා වැදගත්ම වූත් ප්‍රධානතම මාර්ගය වනුයේ ඒ-4 කොළඹ - වැල්ලවාය, මඩකලපුව මාර්ගයට අයත් කොළඹ රත්නපුර කොටසෙහි කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හරහා දිවෙන කොටස වන අතර, එය කොට්ඨාසය හරහා වයඹ - ගිණිකොණ දිශා ඔස්සේ ආසන්න වශයෙන් කි.මී.18.6 ක පමණ දුරක විහිදී යයි.

මෙම ප්‍රධාන මාර්ගයට ප්‍රවේශ විය හැකි පරිදි සැකසුන ද්විතියික මාර්ග ජාලයක් මුළු කොට්ඨාසයම ආවරණය වන පරිදි සැකසී ඇති අතර, ඒ සියල්ල ඒකාබද්ධ වෙමින් සැකසුන සෙසු අතුරු මාර්ග ජාලයක් මුළු කොට්ඨාසය පුරාම විහිදී ඇති අයුරු පහත සිතියමෙහි මනාව පෙන්වා දී ඇත. එමෙන්ම කුරුවිට ශ්‍රීපාද මාර්ගය මෙම කොට්ඨාසය තුලින් වැටී ඇති අතර, අඩවිකන්ද ප්‍රදේශයෙන් ආරම්භ වන එම අඩි පාරද සිතියමෙහි පෙන්වා දී ඇත.


පහත වගු අංක 02 මගින්ද මෙම මාර්ග ව්‍යාප්තිය සාරාංශ කොට ඇත.

**වගු අංක 02 කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාර්ග ව්‍යාප්තිය සාරාංශය**

| මාර්ග තත්ත්වය | දුර (කි.මී) |
|---|---|
| ප්‍රධාන මාර්ග | 18.61 |
| ද්විතීයික මාර්ග | 83.82 |
| සෙසු අතුරු මාර්ග | 418.92 |
| කුරුවිට ශ්‍රීපාද මාර්ගයේ අඩිපාර | 3.55 |


- ඕනෑම ප්‍රදේශයක් සංවර්ධනය වීමෙහිලා මාර්ග සුගමනතාවය ඉතා වැදගත්වේ. එනම් කිසියම් ප්‍රදේශයකට පහසුවෙන් ලගාවිය හැකි බවයි. කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුලද මෙම මාර්ග සුගම්‍යතාවය පෙන්වා දෙනුයේ වඩාත් යහපත් සංවර්ධන විභවයක් මෙම කොට්ඨශය සතු ව පවත්නා බවයි.
- එනම් ප්‍රධාන මාර්ගයට ආසන්නයේ වැඩි ජනාකීර්ණ බවක් මෙන්ම සාපේක්ෂව වැඩි සංවර්ධනයක් පෙන්වයි. කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගයට අයත් කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල දිවෙන කොටස ආශ්‍රිතව ගංවතුර හෝ නාය අවධානම් තත්වයන් වාර්තා නොවීමද විශේෂිත වූවකි.

සිතියම් අංක 04 කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාර්ග ව්‍යාප්තිය



**සිතියම් අංක 05 කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනඝනත්වය**

2019 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සම්පාදිත සම්පත් පැතිකඩෙහි සඳහන් ජනසංඛ්‍යාවත්, මිනින්දොරු දෙපාර්තමේන්තුවේ ග්‍රාම නිලධාරී වසම් මායිම් සිතියමත් පාදක කර ගනිමින් ජනඝනත්ව සිතියම සකසා ඇත. මෙහිදී භූමි ඒකකයකට පුද්ගලයින් සංඛ්‍යාව ගණනය කර ඇති අතර, කොට්ඨාසයේ ජනඝනත්වය වැඩිම වසම වනුයේ දෙල්ගමුවයි. මීට අමතරව උඩකඩ, බෝධිමළුව, පරකඩුව, හා කොස්ගොඩ යන වසම්ද වැඩි ජනඝනත්වයක් සහිත වසම් ලෙසින් වාර්තා වී ඇත. ජනඝනත්වය අඩුම වසම් ලෙසින් වාර්තා වනුයේ අඩවිකන්ද, සූදගල, ඇඳිරියන්වල හා එරත්න හා වළඳුර යන වසම්ය. මෙම තොරතුරු පහත සිතියම් අංක 05 හිත් වගු අංක 03 හිත් පෙන්වා දී ඇත.


කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජන සනත්වය
N
127 B
127
146 A
161
160
160 A
146 B
127 A
127 C
161 B
146
158
161 C
161 A
148
159 D
158 A
157
159 B
159
159 A
157 A
156 C
155 B
159 C
148 A
156 A
155 C
154
155
156
154 B
155 D
154 A
156 B
155 A
154 D
154 E
154 C
සූචිය
ජන සනත්වය
(භූමි ඒකකයකට පුද්ගලයින්)
0.85 - 3.42
3.43 - 6.92
6.93 - 10.00
10.01 - 16.77
16.78 - 27.75
ග්‍රාම නි.වසම් මායිම
0 1,050 2,100 4,200 Meters
මූලාශ්‍රය: 2020 සම්පත් පැතිකඩ ජන සංඛාව හා
මිනින්දෝරු දෙපා. සිතියම
145000
150000
155000
160000
165000
170000
175000
180000
18500